# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යය සාධක සංවිධානය (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යය සාධක සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දිනේෂ් ගුණවර්ධන මහතා විසින් 2017 ඔක්තෝබර් මස 09 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 සැප්තැම්බර් මස 25 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[211 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 18.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 10.00 යි.

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2—PL 010372—260 (2017/10)

# ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යය සාධක සංවිධානය (සංස්ථාගත කිරීමේ)

## ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යය සාධක සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

*පූර්විකාව.*

“ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යය සාධක සංවිධානය” යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සංවිධානය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සංවිධානය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී සංවිධානය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 2017 අංක     දරන ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යය සාධක සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ශ්‍රී ශාක්‍ය සිංහාරාම විහාරස්ථ කාර්යය සාධක සංවිධානය සංස්ථාගත කිරීම.*

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු “සංවිධානය” යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්ය සාධක සංවිධානයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් හඳුන්වනු ලබන) “ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යය සාධක සංවිධානය” යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

*සංස්ථාවේ පොදු පරමාර්ථ.*

3. මෙම සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) අප සංවිධානයේ සාමාජිකයන්ගේ හා අඩු ආදායම් ලාභීන් ඇතුළු පොදු ජනතාවගේ අධ්‍යාපනික, ආර්ථික, ආගමික,

2—PL 005447—300 (2017/09)

සංස්කෘතික, සාමාජීය අවශ්‍යතාවයන් වර්ධනය කිරීමත්, ව්‍යසන අවස්ථාවලදී ධනාත්මක වර්ධනය පිළිබඳ හැඟීම් ඇති කර ඒ තුළින් බලාපොරොත්තු වන්නා වූ ප්‍රතිඵලයන් ළඟා කර ගැනීම;

(ආ) ආගමික සංවර්ධනය හා පුද්ගල සංවර්ධනය වෙනුවෙන් කටයුතු කිරීම;

(ඇ) අධ්‍යාපන සංවර්ධනයට හේතුවන කටයුතු ක්‍රියාවට නැංවීම;

(ඈ) ගුණධර්ම හා සාරධර්ම වැඩි දියුණු කිරීම;

(ඉ) පාසල් ශිෂ්‍ය, පිරිවෙන් ශිෂ්‍ය හිමියන් හා වැඩිහිටි ජනතාවගේ සිංහල, ඉංග්‍රීසි, සංස්කෘතික හා තවත් භාෂාවන් ද, පරිගණක මෙන්ම කාර්මික දැනුම ඇති කිරීම;

(ඊ) ආගමික හා සංස්කෘතික වැඩ සටහන් ක්‍රියාවට නැංවීම;

(උ) සමාජ සුභසාධනය සඳහා දායක වීම;

(ඌ) ආබාධිත හා වැඩිහිටි ජනතාවට පිහිටවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(එ) අප විහාරස්ථානය හා සම්බන්ධ සහෝදර විහාරස්ථාන හා එම භික්ෂූන් වහන්සේ සංවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම;

(ඒ) සංවර්ධනය කළ යුතු ප්‍රදේශ සංවර්ධනය කිරීම; සහ

(ඔ) ඉහත සඳහන් පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ආනුෂංගික වන්නා වූ හෝ හිතකර වන්නා වූ වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, කුලියට දීමට හෝ බද්දට ගැනීමට හෝ අන්‍යාකාරයකින් ලබා ගැනීමට;

(ආ) සංස්ථාවේ කාර්ය සඳහා පොලී සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීමට හෝ ලබාගැනීමට;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, මිළට ගැනීමට, විකිණීමට හා නිකුත් කිරීමට සහ බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ වැසීමට;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් පාලක මණ්ඩලය විසින් සුදුසු යැයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට;

(ඉ) දායක මුදල්, ප්‍රදානයන්, පරිත්‍යාග සහ සියළු වර්ගවල ත්‍යාග ඉල්ලා සිටීමට සහ භාර ගැනීමට;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වන පරිදි, යම් තැනැත්තකු හෝ යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීම;

(උ) යම් චංචල හෝ නිශ්චල දේපළක් කෙරෙහි බලපාන නීත්‍යානුකූල භාර කිසිවක් හෝ කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට;

(ඌ) සංස්ථාවේ සේවකයන් සහ නිලධරයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් නිශ්චය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම; සහ

(එ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය වෙනත් සියලු දේ කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන්නා වූ කළමනාකරණ මණ්ඩලයක් විසින් සංස්ථාවේ කටයුතු පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සංවිධානයෙහි ධුර දරමින් සිටි සාමාජිකයන්ගෙන් සංස්ථාවේ පළමුවන කළමනාකරණ මණ්ඩලය සමන්විත විය යුතු ය.

(3) මේ වගන්තියේ (1) උප වගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, සංවිධානයෙහි ප්‍රථම සභාපතිවරයා සංස්ථාවේ යාවජීව සභාපතිවරයා විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල සාමාජිකයින්ගේ මහා සභා රැස්වීමක දී පැමිණ සංස්ථාවේ රීති ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතරයකින් පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් යමක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල විය යුතු ය:—

(අ) කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම, පත් කිරීම හෝ නම් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ ඔවුන්ගේ ධුර කාලය;

(ආ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ සහ කළමනාකරණ කමිටුවේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, රැස්වීම් පවත්වන වේලාවන්, ස්ථාන සහ රැස්වීම් පිළිබඳ දැන්වීම්, න්‍යාය පත්‍ර සහ රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු පවත්වාගෙන යාම;

(ඈ) සංස්ථාවේ කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය හා කළමනාකරණය,

භාරකාරත්වය සහ එහි අරමුදල් ගිණුම් පවත්වාගෙන යාම සහ විගණනය; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ පසුරාලීම.

(2) (1) උපවගන්තිය යටතේ සාදනු ලබන කවර වුව ද රීතියක්, එවැනිම රැස්වීමක දී සහ එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව වූ දිනයේ දීම පදනමේ බලපැවැත් වූ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය හැකි ය.

(4) සංස්ථාවේ සියළුම සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

7. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. සංස්ථාව සඳහා සහ සංස්ථාව වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබුණු සියලු මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ප්‍රමාණයක සංස්ථාවේ ගිණුමේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවට දේපළ පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා යම් ක්ෂය අරමුදලක් හෝ නිදන් අරමුදලක් සංස්ථාව විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ ගිණුම් සහ විගණනය.**

8. (1) සංස්ථාව විසින් සියලුම ආදායම් සහ වියදම් පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් විගණකවරයකු විසින් වාර්ෂික විගණනය කරනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ මුදල් වර්ෂය සෑම වසරකම ජනවාරි මස 01 වන දිනයෙන් පටන් ගෙන දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් විය යුතු ය.

**සංවිධානය විසින් සහ සංවිධානයට ගෙවිය යුතු මුදල්.**

9. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයෙහි සංවිධානයෙහි පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින්, ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට සංවිධානයට ගෙවිය යුතු ග්‍රාහක මුදල් සහ දයක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.**

10. සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය හා බැරකම් ගෙවා සමථයට පත්කිරීමෙන් පසු, කවර හෝ යම් දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද, වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර, සංස්ථාවේ සභාව විසින් තීරණය කළ යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව.**

11. සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ ලේකම්වරයාගේ භාරයේ තිබිය යුතු අතර, සභාපති හෝ උපසභාපති සහ සභාව විසින් යථා පරිදි පත් කළ වෙනත් යම් සාමාජිකයකු ඉදිරිපිට දී මිස, කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය. එසේ කරනු ලබන අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු කළ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

12. මේ පනතේ සඳහන් තැනැත්තන් හෝ ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නන් හැර ශ්‍රී ලංකා ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

13. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.